

# විදර්ශන

රවි සිරිවර්ධන

## ජීවිතයට නික්ම යාම

එක්වීම හා වෙන් වීම යනු ජීවිතය සමග ලේ නෑකමින් බැඳුන සිදුවීම් සමූහයකි. එනම් ජීවිතය සංයෝගය හා වියෝගය එක්තැන් කළ තොටුපලකි. එකෙකු තොටුපලට පැමිණෙයි. තවකෙක් තොටුපල හැරපියා යයි.

අපි විවධ ලෙස හමුවෙමු. පෙම්වතුන් - පෙම්වතියන්, බිරින්දෑවරුන් - සැමියන්. දෙමාපිය - දූ දරුවන්, සහෝදර - සහෝදරියන්, ප්‍රිය මිත්‍ර සමාගම්.... මේ ආදී විවිධ සමාජ සම්මත හමුවීම් මෙන්ම අසම්මත හමුවීම්ද මේ ජීවන තොටුපළේ අපට දර්ශනය වේ. මේ සකලවිධ එක්වීම් සමග වෙන්වීම් ද උපත ලබයි.

අපි එකිනෙකාගෙන් වෙන්වෙමු. ජීවිත කාලය තුළ සිදුවන එම සියලු වෙන්වීම් එකවර සිහිකර හැකි නොවේ. වරෙක අප සිත් රිදීමෙන් වෙන්වෙමු. තවත් විටෙක ජීවිතයෙන් වෙන්වෙමු. ඇතැමෙත් කලින්ම නික්ම යයි. තවෙකෙක් පමා වී නික්ම යයි.....

ඔබ කලින්ම නික්ම ගියා ය. අප අතර බැඳි සියලු ශාරීරික හා ආධ්‍යාත්මික බැඳීම් හැරපියා ඔබ මේ සොහොන් බිමේ සදාකාලික නිද්‍රාවක සැතපී සිටින්නීය. සියවස් ගණනාවකට පෙර සිටම මෙහි නිදන මිනිසුන්ගේ සන්සුන් නවාතැනට පැමිණි නවමු සමාජිකාව ඔබයි.

තැනක වේලුන ගොක් කොළ ලණුවක එල්ලී සිටිමින් මීට මසකට පමණ පෙර නික්මගිය කිසිවෙකු සිහිපත් කරනු පෙනේ. සියලු තරග නිමාකර මෙහි පැමිණිය ද ජීවත්වන්නන් මෙයද තම අභිමානය කියාපාන තරගබිමක් බවට පත්කොට තිබේ. එකිනෙකට උස ගිය විචිත්‍ර සොහොන්කොත් මතට මමත්වය ආරෝපණය කොට ඇති සෙයකි. පෑෂ්ටිමත් මල් පඳුරු බෙල්ල දිගු කොට තම සවාමියා නිදන සොහොන් කුටි දෙස බලන්නැයි සන්කරනු වැනිය. තව තැනක පෙනෙන තෙල් සිඳීගිය මැටි පහන් අතින්ගත් රතුපස් ගොඩ කියා සිටින්නේ පීඩිතයෙතු නිදන හතර රියනේ දුක්බර කතාව විය හැකිය. නම් ගම් කුළගොත් එහි නැත. මේ භූමියට නම් වාසගම් අවැසි නැතැයි මම සිතමි.

කුඩා වතුසුද්ද ගසක් අතින්ගත් ඔබේ සොහොන්ගෙය මම සොයාගතිමි. සියලු දෙනා සමග පැමිණ ඔබ මෙහි නතරකොට ගිය පසු මා මෙහි තනිව ආ පළමුවතාව මෙයයි. රතුපස්ගොඩ වසාගෙන හිතුවක්කාර ලෙස වැඩෙන තණපත් නෝක්කාඩු කියනු වැනියයි මට සිතේ.

මෙහි ගෙන එන්න කසිවක් මට නොමැත. ඔබ සමග විඳගත් අතීත මතක කළඹා ඔබේ නිසංසල සමාධිය අභිමුව හැඟුම්බර වී ඒ සමාධිය බිඳින්නට මට නොහැකිය. මා ඔබට නෝක්කාඩු නොකියමි. මන්ද ඔබ මා වෙත ඉතිරිකර ගිය ප්‍රේමය මරණයෙන් කෙළවර නොවන බැවිනි. ඔබ ඉතිරි කළ ඒ අනුස්මරණීය හැඟුම් සමග ජීවත්වීම ඔබට පුදන පරම බුහුමන යයි මම සිතමි. ඒ ප්‍රේමය ලොවට බෙදා දී ඒ පින් ඔබට අනුමෝදන් කරමි.

මරණයට ඔබේ ජීවිතය කෙළවර කළ හැකි වුවද ඔබේ ආධ්‍යාත්මය වගුල ප්‍රේමය කෙළවර කළ නොහැකි බවම ඔප්පුකර පෙන්වමි. ඊට ඔබේ රුව ඇඹිය යුතුනොවේ. අටරියන් සොහොන් කොත් ඉදිකළ යුතු නොවේ. කළ යුතුව ඇත්තේ මේ සුසානයෙන් පිටට ඔබගේ අචල ප්‍රේමය රැගෙන යාමයි. එබැවින් මම මෙහි හිස් අතින් පැමිණියද හිස් අතින් නොයමි. ඒ අනුස්මරණීය ප්‍රේමය රැගෙන ජීවිතයට නික්මයාමට නියත විවරණ ලබනු පිණිස සපැමිණි ගමනකි මේ. එක පහනින් පහන් සිය දහසක් අවුළුවාලිය හැකිවා සේ ඔබේ ප්‍රේමය මිනිස් සමාජය මත බෝ කර හරිමි.......

හාත්පස පරිසරය කළුවරට ගොදුරු වී තිබේ. සුසානය කෙළවර ඇවිලෙන චිතකයක එළියෙන් පාර අසාගෙන මම ඔබෙන් සමුගෙන ජීවිතයට නික්ම යමි. ඔබට සුබ රාත්‍රියක්........

# ජපන් රස කතා



ජපන් සෙන් කතා

## දිය බිඳුවක කතාව

ගිසන් නමැති එක් සෙන් ආගමික ගුරුවරයෙක් තම ශිෂ්‍යයෙකුට කතා කොට සිය නාන බේසමේ උණු වතුර සිසිල් කර ගැනීම සඳහා වතුර පනිට්ටුවක් ගෙන එන මෙන් කීවේය.

ශිෂ්‍යයා වතුර පනිට්ටුව ගෙනැවිත් නාන බේසමේ ජලය හා මුසු කොට ඉතිරි වු ජලය ස්වල්පය බිමට විසි කලේය.

මෝඩයා! ගුරුතුමා ඔහුට බැණ වැදුණෝය.

ඇයි ඒ වතුර ටික අර පැලයක් මුලට දැම්මෙ නැත්තෙ? පන්සලේ තියෙන වතුර බිංදුවක් හරී අපතේ යවන්න මොකක්ද නුඹට තියෙන අයිතිය?

ඒ මොහොතේම ශිෂ්‍යයා සෙන් දහම ගැන පැහැදුණෝය. ඔහු සිය පැවිදි දිවියේ නමද තෙකිසුයි, එනම් දිය බිඳුව යනුවෙන් වෙනස් කර ගත්තේය.

ශ්‍රියා කුමාරසිංහ


# Skilled Migration
Post 1st September 2007
## New rules are now in effect..
It is imperative to obtain most precise and accurate advice for eligibility criterion..

Now we offer our services in Australia & Sri Lanka for individuals who possess genuine documents



We Deliver Results..

GUSS DESIGN



Susantha Katugampala L.L.B (Monash)
Barrister & Solicitor
Immigration Lawyer
Migration Agent Reg: 96-86306

FAIRFIELDS
IMMIGRATION LAWYERS - MELBOURNE

*Melbourne office:*
Tel: 03 9650 4557 Mob: 417 851 041 Fax: 03 9650 4559
Interstate : 1300 888 331
10, Morrison Place,
East Melbourne 3002

*Colombo Office:*
Colombo Hilton Residence (JAIC Hilton Towers)
Ground Floor, 200, Union Place
Colombo 02
Contact: Dulani or Anjana 0777 347 670

**Email: fairfields.lawyers@bigpond.com**